දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

ආවිප්‍ර 1.1 - ආර්ථික විශ්ලේෂණය
EC 1.1 – Economic Analysis

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
ගණක යන්ත්‍ර හෝ වෙනත් තාක්ෂණික උපකරණ භාවිතයට අවසර නැත.

---

01. i. නිදසුන් යොදා ගනිමින් ආර්ථික භාණ්ඩ සහ ආර්ථික නොවන භාණ්ඩ (free goods) අර්ථ දක්වන්න.
(ලකුණු 05)

ii. වැව් බැම්මක් මත සිට ගත් විට ඔබට දර්ශනය විය හැකි දෑ පිළිබඳ මෙනෙහි කරමින් ඒවා භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන ආර්ථික සම්පත් හතරට අයත් වන සේ බෙදා දක්වන්න.
(ලකුණු 05)

iii. වෙළෙඳපොළ ආර්ථිකයක් අවශ්‍යයෙන්ම ධනේශ්වර ආර්ථිකයක් වන්නේ ද? විධානගත ආර්ථිකයක් අවශ්‍යයෙන්ම සමාජවාදී ආර්ථිකයක් වන්නේ ද? යන්න පැහැදිලි කරන්න.
(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාව කෙතෙක් දුරට සමාජවාදී වෙළඳපොළ ආර්ථික පද්ධතියක් ලෙස සැලකිය හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.
(ලකුණු 05)

02. i. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් නිර්මාණය කිරීමේ දී පදනම් කර ගනු ලබන උපකල්පන කවරේ ද?
(ලකුණු 04)

ii. මූලයට අවතල නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් වඩාත් ප්‍රායෝගික යැයි කියනු ලබන්නේ ඇයි?
(ලකුණු 05)

iii. ස්ථාවර ආවස්ථික පිරිවැය පිළිබිඹු කෙරෙන නිෂ්පාදන හැකියා මයිම් වක්‍ර යොදා ගනිමින් පහත සඳහන් සිදුවීම් නිරූපනය කරන්න.
(a) පුහුණු ශ්‍රමිකයන් විශාල වශයෙන් රට හැර යාම
(b) වඩා ඵලදායී නව පොහොර වර්ගයක් හඳුන්වා දීම
(c) වෘත්තීය සමිති ක්‍රියාමාර්ග නිසා කර්මාන්තශාලා තාවකාලිකව වසා තැබීම.
(ලකුණු 06)

iv. මෙතෙක් අත්හුරු ක්‍රමයට කරනු ලැබූ රජයේ සියලුම කාර්යාල කටයුතු පරිගණක ගත කිරීමට තීරණය කළහොත් එමගින් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට සහ නිෂ්පාදනය කරනු ලබන ලක්ෂ්‍යට විය හැකි බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

03. තරඟකාරී වෙළෙඳපොළක අලෙවි කරනු ලබන එක්තරා භාණ්ඩයක් සඳහා අදාළ ඉල්ලුම් සැපයුම් වක්‍ර පහත සමීකරණ මගින් විස්තර වේ.

$$Q^d = 30 - 2p$$
$$Q^s = -2 + 2p$$

i. සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 05)

ii. වෙළෙඳපොළ සමතුලිතයේ දී මිල ඉල්ලුම් නම්‍යතාව සහ නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න.

(ලකුණු 05)

iii. මෙම භාණ්ඩ ඒකකයක් මත රු. 10 වන සේ අවම මිලක් පැනවුවහොත් පැන නැගිය හැකි අධි සැපයුම කොපමණ ද? අවම මිල සාර්ථක කර ගැනීම සඳහා මෙහිදී රජය විසින් ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද?

(ලකුණු 05)

iv. මෙම භාණ්ඩයෙන් ඒකක 16 ක් ආනයනය කිරීම සඳහා පෞද්ගලික අංශය ඉදිරිපත් වන්නේ නම් ආනයනික භාණ්ඩ ඒකකයක් දේශීය වෙළඳපොළෙහි අලෙවි කෙරෙන මිල කුමක් ද?

(ලකුණු 05)

04. පහත සඳහන් සිද්ධීන් ආර්ථික විද්‍යාත්මකව පහදන්න.

i. (a) ඔබ දුම්රිය මාර්ගයක් අසලින් ගමන් කරනා විට මැණික් ගලක් දුටුවහොත් එය අහුලාගෙන යන නමුත්, කොන්ක්‍රීට් ගල් කැබලි අහුලාගෙන යාමට උත්සුක නොවේ.

(ලකුණු 03)

(b) ඉහළ ආදායම් ලබන්නන්ගෙන් බදු අයකර පහළ ආදායම් ලබන්නන්ට සහනාධාර ලෙස ලබාදීමෙන් සමාජ සුභසාධනය ඉහළ යන්නේ යයි ආණ්ඩුව විශ්වාස කරයි.

(ලකුණු 03)

ii. $$\frac{MU_x}{P_x} = \frac{MU_y}{P_y} = \cdots \lambda$$
$$P_xQ + P_yQ_y = I$$

ඉහත දක්වෙන්නේ පුද්ගලයෙකුගේ තෘප්තිය උපරිම කිරීම සඳහා සම්පූර්ණ විය යුතු බවට ඇල්ෆ්‍රඩ් මාර්ෂල් විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි දෙකයි.


එම කොන්දේසිවලින් කියවෙන අදහස ඔබේ වචනවලින් ලියන්න. එම කොන්දේසි බිඳ වැටෙන අවස්ථාවක තෘප්තිය උපරිම නොවන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. ඉල්ලුම් වක්‍රයක් ප්‍රමාණ අක්ෂය ඡේදනය කරන්නේ මන්දැයි ආන්තික උපයෝගිතා න්‍යාය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

05. i.




රූපය 1

ඉහත රූප සටහනේ දක්වෙන්නේ පූර්ණ තරගකාරී වෙළෙඳපොළක තනි ආයතනයක් සම්බන්ධ පිරිවැය හා අයභාර තත්ත්වයයි. දී ඇති දත්ත අනුව

(a) ආයතනය ලාභ උපරිම කරන අවස්ථාවේ දී මුළු පිරිවැය (TC), මුළු අයභාරය (TR) සහ මුළු ලාභය ගණනය කරන්න.

(ලකුණු 05)

(b) වෙළෙඳපොළ මිල රු. 18/= හා රු.9/= ලෙස වෙනස් වූ අවස්ථාවල දී ආයතනය ඊට ප්‍රතිචාර දක්වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(c) මෙම ආයතනය භාණ්ඩ ඒකක 60 ක් නිපදවන අවස්ථාවක සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) ගණනය කරන්න.

(ලකුණු 05)

ii. පූර්ණ තරගකාරී කර්මාන්තයක දිගු කාලයේ දී සෑම ආයතනයක්ම ප්‍රාමාණික ලාභ (Normal profits) පමණක් ලබන තත්ත්වයට පත්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

06. i. ලාභ උපරිම කිරීම අරමුණු කොටගත් ඒකාධිකාරී ආයතනයක ලාභය මත ප්‍රතිශතයක බද්දක් පැනවූ විට ආයතනය සිය නිමවුම් මට්ටම සහ අය කරනු ලබන මිල සම්බන්ධයෙන් කවර තීරණ ගනු ලබන්නේ ද?

(ලකුණු 05)

ii. "ඒකාධිකාරී ආයතනයක් සෑම විටම නිපදවනු ලබන්නේ වෙළෙඳපොළෙහි උපරිම ඉල්ලුම් ප්‍රමාණයෙන් හරි අඩකට වඩා අඩු ප්‍රමාණයකි" සුදුසු රූප සටහන් යොදා ගනිමින් මෙම ප්‍රකාශය සාධනය කරන්න.

(ලකුණු 05)

iii. නිෂ්පාදන සාධක සම්බන්ධ;
ආර්ථික බදු කුලී (Economic rent) හා
සංක්‍රාම ඉපයුම් (Transfer earnings) අර්ථ දක්වන්න.

(ලකුණු 05)

iv. "ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ ඉපයීම්වලින් වැඩි කොටසක් ආර්ථික බදු කුලී වලින් සමන්විත වන අතර, ක්‍රිකට් ක්‍රීඩාංගනයේ සනීපාරක්ෂක කම්කරුවන්ගේ වැටුප්වලින් වැඩි කොටසක් සංක්‍රාම ඉපයීම්වලින් සමන්විත වේ. සාධක වෙළෙඳපොළ සම්බන්ධ යෝග්‍ය රූපසටහන් භාවිත කරමින් මෙම ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 05)

07. i. මුදල් රහිත ආර්ථිකයක හුවමාරු කාර්යයේදී පැන නගින "ද්විත්ව සමපාත නොගැලපීම" නම් ගැටළුවට මුදල් හඳුන්වාදීමෙන් පසුව විසඳුම් ලැබෙන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. වාණිජ බැංකු ශේෂ පත්‍රයේ ද්‍රවශීල වත්කම් හා අද්‍රවශීල වත්කම් සඳහා උදාහරණ දෙක බැගින් දක්වා, "ද්‍රවශීලතාව" හා "ලාභදායකත්වය" එකිනෙක ගැටෙනසුළු අරමුණු බවට පත්වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. "මූල්‍ය ප්‍රතිපත්තිය" යන්න නිර්වචනය කොට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති තුළ එන අවසාන ඉලක්කය, අතරමැදි ඉලක්කය හා මෙහෙයුම් ඉලක්කය විස්තර කරන්න.

(ලකුණු 05)

iv. සිංහල - දමිළ අලුත් අවුරුදු සමයේ භාණ්ඩ හා සේවාවල ඉල්ලුම විශාල වශයෙන් ඉහළ යන නමුත් මිල විශාල වශයෙන් ඉහළ නොයයි. උද්ධමනය සම්බන්ධ ඔබ උගත් සංකල්ප ඇසුරින් මෙම තත්ත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

08. i. කල්පිත ආර්ථිකයක් හා සම්බන්ධ සාර්ව ආර්ථික දත්ත පෙළක් මතු දැක්වේ. (දී ඇති දත්ත රුපියල් මිලියන වලිනි.)

| | | |
|---|---|---|
| පෞද්ගලික පරිභෝජනය | C | $= 1500 + 0.8\,Y^d$ |
| ආයෝජන වියදම | I | = 500 |
| රාජ්‍ය වියදම | G | = 200 |
| බදු | T | = 250 |

(a) සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 08)

(b) රාජ්‍ය වියදම් රු. මිලියන 300 කින් ඉහළ දැමීමට තීරණය කළහොත් සමතුලිත ආදායම් මට්ටම කෙසේ වෙනස් වන්නේ ද?

(ලකුණු 03)

(c) එම නව සමතුලිත ආදායම් මට්ටමේ දී, පෞද්ගලික ඉතුරුම් ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 03)

(d) රටක ආර්ථික වෘද්ධිය මිණුම් කිරීම සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය යොදා ගැනීමේ දුර්වලතා කවරේ ද?

(ලකුණු 06)

09. පහත සඳහන් මාතෘකා අතුරින් <u>හතරක් (04)</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. අර්වින් පිෂර්ගේ විනිමය සමීකරණය

ii. ඩේවිඩ් රිකාඩෝගේ සාපේක්ෂ වාසි න්‍යාය

iii. ගෙවුම් ශේෂය හා ජාතික ගිණුම් අතර සම්බන්ධතාව

iv. පාවෙන විනිමය අනුපාත ක්‍රමයක වාසි හා අවාසි

v. ගෙවුම් ශේෂ හිගය සහ විනිමය අනුපාතය අතර සම්බන්ධතාව

vi. ආසන්න මුදල් හා මුදල් ආදේශක

(එක් කොටසකට ලකුණු 05 බැගින් මුළු ලකුණු 20)